**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය - 2017**

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 20 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති
-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03**
----------------------------------------------

ප්‍රමිතයේ 47 ඡේදය ප්‍රකාරව 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මණ්ඩලයට ලැබුණු ප්‍රාග්ධන වියදම් සඳහා වූ රජයේ ප්‍රදාන වලට අදාළ ගිණුම්ගත නොවූ ක්‍රමක්ෂය වටිනාකම වූ රු.1,528,669 ක් පූර්ව කාලපරිච්ඡේද වැරදි නිවැරදි කිරීම පිණිස ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ 2015 දෙසැම්බර් 31 දිනට දැක්වෙන ප්‍රාග්ධන දායකත්ව ගිණුමට සහ සමුච්චිත අතිරික්තතා ගිණුමට සමාලෝචිත වර්ෂයේදී ගලපා තිබුණ ද, ප්‍රමිතියේ 54 වගන්තිය ප්‍රකාර පෙර කාලපරිච්ඡේද වරදෙහි ස්වභාවය, රේඛීය අයිතමයන් සඳහා නිවැරදි කළ යුතු මුදල ආදී කරුණු ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09**
-----------------------------------------------

ප්‍රමිතයේ 15 වගන්තිය ප්‍රකාර තොග වටිනාකම, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් වඩා අඩු අගය මත වාර්තා කළ යුතු වුවද, පිරිවැය වූ රු.205,213 ක්වූ පැරණි පොත් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම
------------------------------------

අවසාන තොගයේ ඇතුළත් රු.242,780 ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය තොගය වෙනුවෙන් යාවත්කාලීන කරන ලද තොග ලේඛනය සහ පිරිවැය රු.211,913 ක් වූ පුස්තකාල පොත් වලට අදාළව පරිග්‍රහන ලේඛනයක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 102 සිට 105 දක්වා | සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ගණක යන්ත්‍ර, මේස පිහි වැනි අස්ථානගත භාණ්ඩ හඳුනාගෙන ඇතත් යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 880 | රජයේ මුදල් භාර ගැනීම හෝ භාරව සිටින නිලධාරීන්, රජයේ ගිණුම්වලට අදාළ ගෙවීම් වවුචර සහතික කරන හා චෙක්පත් අත්සන් කරන නිලධාරීන්, ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් මණ්ඩලය තුළ අදාල කාර්යයන්හී නියුක්ත නිලධාරීන් දෙදෙනෙකුගෙන් විගණන දිනය වූ 2018 මැයි 31 දක්වාම ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 506,418 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 480,595 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීම රු. 25,823 කි. සමාලෝචිත වර්ෂයේ දී මණ්ඩලයේ අනෙකුත් මෙහෙයුම් වියදම් රු.1,022,884 කින් වැඩි වුවද රජයේ දායකය රු.1,089,000 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩ මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණු අතර 2016 සහ 2017 වර්ෂ වලදී එය අතිරික්තයක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් ගැලපීමෙන් පසු 2016 වර්ෂයේ දී රු. 12,511,489 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේ දී රු. 12,750,053 ක් දක්වා සියයට 2 කින් වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුවත්පත් මණ්ඩල පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව පුවත්පත්වල පළ වන අසත්‍ය, අපකීර්තිමත්, මහජන සදාචාරයට හානිකර හෝ යම් අශෝභන හෝ අශ්ලීල ප්‍රකාශ සම්බන්ධව සොයා බලා වරදකරුවන් අධිකරණය වෙත යොමු කිරීම සඳහා මණ්ඩලයට බලතල තිබුණ ද, මණ්ඩලය විසින් එවැනි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) පුවත්පත් මණ්ඩල පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව සෑම පුවත්පතක්ම පුවත්පත් මණ්ඩලයේ ලියාපදිංචි කළ යුතු අතර එලෙස ලියාපදිංචි නොකර වෙළඳපලට නිකුත්කරන පුවත්පත් සම්බන්ධව අවශ්‍ය රීති හා නියෝග සම්පාදනය කිරීමට පනතේ 30 වන වගන්තිය ප්‍රකාරව බලය තිබුණ ද, මණ්ඩලය විසින් ඒ සඳහා රීති පිළියෙල කර නොතිබුණි. ලියාපදිංචි කළ යුතු පුවත්පත් සංඛ්‍යාව ලෙස මණ්ඩලය තක්සේරු කළ සංඛ්‍යාව 300 ක් වුවද 2016 සහ 2017 වර්ෂවල ලියාපදිංචි කළ පුවත්පත් සංඛ්‍යාව පිළිවෙලින් 230 ක් සහ 199 ක් විය. නමුත් වෙළඳපල තුළ ලියාපදිංචියකින් තොරව අලෙවිය සිදුකරන පුවත්පත් පිළිබඳව විමර්ෂණ කිරීමට මණ්ඩලය කටයුතුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රවෘත්ති පත්‍ර වලට විරුද්ධව මහජනතාව සහ විවිධ ආයතනවලින් පැමිණිලි 49 ක් ලැබී තිබුණු අතර 2016 වර්ෂයේ නොවිසඳී තිබූ පැමිණිලි 52 ක් ද සමඟ විසඳීමට තිබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 101 ක් විය. ඉන් පැමිණිලි 35 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද විසඳා නොතිබුණි. එම නොවිසඳූ පැමිණිලි 35 න් 16 ක් වසරක සිට වසර 4 ක් දක්වා විසඳීමට ප්‍රමාද වූ ඒවා විය.

(ඈ) ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදුකෙරේ.

(i) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මණ්ඩලය විසින් සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම අනුව එහි ඇතුළත් වූ පුවත්පත් කලාවේදීන්ගේ භාෂා දැනුම වර්ධනය සඳහා වන සහතිකපත් පාඨමාලාව පවත්වා නොතිබුණි.

(ii) වැඩ සටහන් 04 ක් සම්බන්ධයෙන් එහි සඳහන් ඉලක්කයන් සියයට 19 සිට සියයට 44 දක්වා ඉටු නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

(iii) ප්‍රාදේශීය මාධ්‍යවේදී හා පාසල් ජනමාධ්‍යවේදී වැඩමුළු 14 ක් පැවැත්වීම ඉලක්ක කොටගෙන මහා භාණ්ඩාගාරයෙන් රු. 2,710,000 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණු අතර වැඩසටහන් 12 ක් පවත්වා ඒ සඳහා රු. 2,134,000 ක් වැය කර තිබුණි.

(iv) 2016 වසරේදී ද සැලසුම් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේද ඇතුළත් වූ සාක් කලාපීය රටවල්වල මාධ්‍යවේදීන් සඳහා සම්මන්ත්‍රණ වර්ෂය අවසානය වන විටත් පවත්වා නොතිබුණු අතර ඒ සඳහා රු. 2,500,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය හා පුවත්පත් පැමිණිලි කොමිසම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් සිදුකර පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා ගිවිසුමකට එළඹ ඒ වෙනුවෙන් රු. 200,000 ක අත්තිකාරම් මුදලක් කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අංශය වෙත 2015 නොවැම්බර් 24 දින ගෙවා තිබුණු අතර සමස්ත පර්යේෂණ වාර්තාව එම ගෙවීමෙන් මාසයක් ඇතුළත ඉදිරිපත් කළ යුතුව තිබුණද 2018 අප්‍රේල් 25 දින වන විටත් එම වාර්තාව මණ්ඩලය වෙත ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේදී සහ ඊට පෙර වර්ෂ වලදී අලෙවි කිරීම සඳහා ජනමාධ්‍ය විෂයය පිළිබඳව මුද්‍රණය කළ පොත් තොගයකින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පිරිවැය රු. 271,758 ක් වූ පොත් 2401 ක් ඉතිරිව තිබුණි. මෙම පොත් අලෙවි වීම ඉතා අඩු මට්ටමක පැවතීම හේතුවෙන් වැඩි ප්‍රමාණයක් නොමිලේ බෙදා හැරීම මණ්ඩලයේ සාමාන්‍ය සම්ප්‍රදාය වී තිබුණි.

(ඇ) 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008 ප්‍රකාරව සියළුම රාජ්‍ය ආයතන විසින් තම ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය හඳුන්වා දී ක්‍රියාත්මක කළ යුතු වුවද එවැන්නක් පිළිබඳ මණ්ඩලය දැනුවත්ව නොතිබුණු අතර චක්‍රලේඛයේ ඇතුළත් විධි විධාන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 23 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් මාස තුනක් ඇතුළත පත්කළ යුතු තොරතුරු නිලධාරියා සහ අභියාචනා විභාග කිරීම සඳහා නම්කළ නිලධාරියකු පත්කර නොතිබුණු අතර පුවත්පත් කොමසාරිස්වරයා තොරතුරු නිලධාරී ලෙස කටයුතු කර තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

මණ්ඩලය විසින් පිළිවෙලින් 1993 නොවැම්බර් 05 සහ 2009 සැප්තැම්බර් 07 යන දිනයන් හි ආරම්භ කරන ලද පර්යේෂණ අරමුදල සහ ණය අරමුදල සඳහා බැංකු ගිණුම් දෙකක් පවත්වාගෙන යන අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුම්වල ශේෂය පිළිවෙලින් රු.2,540,636 ක් සහ රු. 1,601,416 ක් විය. අංක එෆ්අයිඑන්/පීඊඑන්/168 සහ 2017 දෙසැම්බර් 19 දිනැති මණ්ඩලයේ සභාපතිගේ ලිපිය මගින් මෙම අරමුදල් ගිණුම් පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ඉල්ලා තිබුණ ද 2018 අප්‍රේල් 25 දින වන විටත් එම අනුමැතිය ලැබී නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

2013 වර්ෂයේ සිට අනුමත වී තිබුණු සහකාර පුවත්පත් කොමසාරිස්, පරිපාලන නිලධාරී සහ කාර්යාල කාර්ය සහායක වශයෙන් තනතුරු තුනකට අදාළව පුරප්පාඩු 04 ක් පැවතුණු බැවින් මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම, සේවක පරිපාලනය ආදී කටයුතු නිසියාකාරව ඉටු කිරීමට අපහසු වී තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

---

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

---

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) නමුත් ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත මණ්ඩලය විසින් සිය විෂය පථයට අනුව ලඟා කර ගත යුතු අරමුණු හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ හෙයින් ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟා විය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තවද ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රතිපාදන වෙන්කිරීම, අවශ්‍ය මානව හා භෞතික සම්පත් හඳුනාගැනීම, තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් (Stakeholders) හඳුනාගැනීම ආදී කාර්යයන්ද සමාලෝචිත වර්ෂය තුළ සිදුවී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

### 6.1 අභ්‍යන්තර විගණනය

---

මුදල් රෙගුලාසි 133 හා මුදල් රෙගුලාසි 134 ප්‍රකාරව මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක නොවන අතර මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයට අභ්‍යන්තර විගණන තනතුරක් ඇතුළත් කර නොතිබුණි.

### 6.2 විගණන කමිටු

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව, අවම වශයෙන් කාර්තුවකට වරක් බැගින් වර්ෂයකට රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී කමිටු රැස්වීම් 2ක් පමණක් පවත්වා තිබුණි.

### 6.3 අයවැය පාලනය

---

අයවැයගත හා තත්‍ය ආදායම් අතර සියයට 12 සිට සියයට 98 දක්වාත් අයවැයගත හා තත්‍ය වියදම් අතර සියයට 6 සිට සියයට 24 දක්වාත් විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

### 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය සම්බන්ධයෙන් 2014 ජූලි 24 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී ලබාදුන් නියෝග වූ අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කිරීම හා විගණකාධිපති වෙත වාර්තා ඉදිරිපත් කිරීම, විධිමත් පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සහ මණ්ඩලයේ පුරප්පාඩු වී ඇති විධායක තනතුරු සඳහා නිලධාරීන් පත් කිරීම ආදී කාර්යයන් ඉටු කර නොතිබුණි.

(ආ) 2010 මැයි 14 දිනැති අංක සීඡ්/1/17/1 දරන ජනාධිපති ලේකම් කාර්යාල ලිපියේ 1 ඡේදය සහ පොදු ව්‍යාපාර කාරක සභාවේ 2012 ජුලි 10 දිනැති අංක 7 නියෝගය අනුව පුවත්පත් මණ්ඩලය රජයේ ගොඩනැගිල්ලක පවත්වාගෙන යායුතු බව අවධාරණය කර තිබුණද මණ්ඩලය ආරම්භයේ සිට වසර 40 ක පමණ කාලයක් කුලියට ලබාගත් පෞද්ගලික ගොඩනැගිලි වල පවත්වාගෙන ගොස් තිබුණ අතර, ඒ වෙනුවෙන් 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පමණක් ගොඩනැගිලි කුලී වශයෙන් රු.18,806,500 ක් වැය කර තිබුණි. රජයේ ගොඩනැගිල්ලක් සපයා ගැනීමට ඇති අපහසුතාවය මත මෙම තත්ත්වය උද්ගතවී ඇති බව මණ්ඩලයේ සභාපතිවරයා විගණනයට වාර්තා කර තිබුණි.

## 6.5 සමාජ වගකීම් ඉටුකිරීම

1981 ඔක්තෝබර් 14 දිනැති අංක 162/5 ඒ දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර තිබෙන පුවත්පත් කලාවේදීන් සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහයට අනුව දිනපතා පළවන පුවත්පත් විමර්ශනය කර බැලීම සඳහා ක්‍රමවේදයක් පැවතියද පළවන පුවත්පත් ප්‍රමාණය හා සසඳන කළ සීමිත විමර්ශන වාර්තා ප්‍රමාණයක් පමණක් ඉදිරිපත් කර තිබුණි. එකී විමර්ශන වාර්තා සම්බන්ධයෙන් ද ආචාරධර්ම පිළිපැදීම පිළිබඳව අවශ්‍ය ඇගයීම් සිදුකිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොතිබුණි.

## 07. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මණ්ඩලයේ අරමුණු ක්‍රියාත්මක කිරීම | (i) පුවත්පත්වල පළවන අසභ්‍ය, අපකීර්තිමත්, මහජන සදාචාරයට හානිකර හෝ යම් අශෝභන හෝ අශ්ලීල ප්‍රකාශ සම්බන්ධව කටයුතු නොකිරීම.<br>(ii) වෙළඳපලේ අලෙවි වන පුවත්පත් ලියාපදිංචි කරවීමට කටයුතු නොකිරීම.<br>(iii) දිනපතා පළවන පුවත්පත් විමර්ශනය නොකිරීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | අනුමත තනතුරු පුරප්පාඩුව පැවතීම. |
| (ඇ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබීම. |